# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,500 - 2026 ජූලි මස 31 සිකුරාදා - 2026.07.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස (II අ) වැනි කොටස - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)



| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු ... ... | - | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... ... | - |



*සැ.යු.*: දූෂණ විරෝධී (සංශෝධන) පනත් කෙටුම්පත 2026.07.24 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **සතියකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 අගෝස්තු මස 21 දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 අගෝස්තු මස 07 දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ප්‍රසන්න ජයරත්න,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2026 අප්‍රේල් මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

0000 - B 82815 - (2026/07)
E - 01

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සැම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. යුද්ධ සේවා අනුග්‍රහය

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සැම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපෙදස්

සැ. යු. : "මින්පෙර පළ වූ ගැසට් නිවේදන සියල්ලෙහි ම සඳහන් විභාග අපේක්ෂකයින් සඳහා නීති හා උපදෙස් යන මැයෙන් පළ කරනු ලබන නීති හා උපදෙස් මාලාව මෙමගින් අවලංගු කරනු ලබන අතර මින් ඉදිරියේ දී බලපවත්වනු ලබන්නේ මෙම ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නීති හා උපදෙස් මාලාවයි."

2026 ජූලි මස 22 වැනි දින,
ඒ. කේ. එස්. ඉන්දිකා කුමාරි ලියනගේ,
විභාග කොමසාරිස් ජනරාල්.

අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :

"1968 අංක 25 දරන විභාගපනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාගඅපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. ඨ"

(i)විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii)යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක වක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii)යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු ඇබෑර්තු

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ (සිංහල) රෙජිස්ට්‍රාර් තනතුරු

**පුත්තලම දිස්ත්‍රික්කය**

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවලට අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ:

01. අයදුම්කරුවන් අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර වැටුප් නොලබන සේවාවක් වන අතර, ඒ සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55ට නොවැඩි විය යුතු ය.

04. විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 65 වන අතර, වයස අවුරුදු 65-70 දක්වා රෙජිස්ට්‍රාර්වරයාගේ රාජකාරි ඉටු කිරීමේ ස්වභාවය, කායික හා මානසික යෝග්‍යතාව අනුව වසරින් වසර සේවය දීර්ඝ කිරීම සිදු කෙරේ. එලෙස සේවය දීර්ඝ නොකරන ඕනෑම අවස්ථාවක අදාළ රෙජිස්ට්‍රාර්වරයාගේ සේවය අවසන් කරනු ලැබේ.

05. මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර්ධුරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අය විය යුතු අතර වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

06. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල/දෙමළ භාෂාව (තනතුරට අදාළ භාෂා මාධ්‍ය) සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

*සැ. යු.-* අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවල දී, එය එක් විෂයයක් ලෙස සැළකිය යුතු ය. එම විෂය කොටස් දෙකම සමත් නම් පමණක් විෂය සමත් ලෙස සැලකිය යුතු ය.
මවුලවි සහතිකය හෝ අරාබි ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම, ඉහත සඳහන් මූලික සුදුසුකම් සපුරා තිබීම සේ සලකනු ලැබේ.

07. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

08. අයදුම්පත් කැඳවනු ලබන මුස්ලිම් විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරී වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

09. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

10. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2026 අගෝස්තු මස 31 දින** හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් යැවිය යුතු ය.

**එස්. ජලදීපන්,**
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2026 ජූලි මස 08 දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| පුත්තලම | මුන්දලම | පුත්තලම් පත්තු කොට්ඨාසයේ පෙරුක්කුවට්ටන් ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය (සිංහල මාධ්‍යය) | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පුත්තලම |
| පුත්තලම | හලාවත | උතුරු පිටිගල් කෝරළය කොට්ඨාසයේ හලාවත නගර ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය (සිංහල මාධ්‍යය) | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පුත්තලම |

07 - 484

---

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

සිංහල මාධ්‍ය උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරු

**බදුල්ල දිස්ත්‍රික්කය**

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ / අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ:-

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ / අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර වැටුප් නොලබන සේවාවක් වන අතර, ඒ සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය.

04. විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 65 වන අතර, වයස අවුරුදු 65-70 දක්වා රෙජිස්ට්‍රාර්වරයාගේ රාජකාරි ඉටු කිරීමේ ස්වභාවය, කායික හා මානසික යෝග්‍යතාව අනුව වසරින් වසර සේවය දීර්ඝ කිරීම සිදු කෙරේ. එලෙස සේවය දීර්ඝ නොකරන ඕනෑම අවස්ථාවක අදාළ රෙජිස්ට්‍රාර්වරයාගේ සේවය අවසන් කරනු ලැබේ.

05. විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අයවිය යුතු අතර වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

06. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02 ක් සහිතව විෂයයන් 06 කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

*සැ. යු.-* අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවල දී, එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂයය කොටස් දෙකම සමත් නම් පමණක් විෂයය සමත් ලෙස සැලකිය යුතු ය.

07. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

08. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

09. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් "ඇමුණුම I" අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

10. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2026 අගෝස්තු මස 31 දින** හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

**එස්. ජලදීපන්,**
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2026 ජූලි මස 07 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| බදුල්ල | වැලිමඩ | බොරලන්ද කොට්ඨාසයේ උප්පැන්න, මරණ සහ උඩුකිඳ කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, බදුල්ල |

07 - 485

---

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

සිංහල මාධ්‍ය උප්පැන්න, මරණ හා විවාහ / අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරු

**මොණරාගල දිස්ත්‍රික්කය**

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ / අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ:-

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ / අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර වැටුප් නොලබන සේවාවක් වන අතර, ඒ සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය.

04. විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 65 වන අතර, වයස අවුරුදු 65-70 දක්වා රෙජිස්ට්‍රාර්වරයාගේ රාජකාරි ඉටු කිරීමේ ස්වභාවය, කායික හා මානසික යෝග්‍යතාව අනුව වසරින් වසර සේවය දීර්ඝ කිරීම සිදු කෙරේ. එලෙස සේවය දීර්ඝ නොකරන ඕනෑම අවස්ථාවක අදාළ රෙජිස්ට්‍රාර්වරයාගේ සේවය අවසන් කරනු ලැබේ.

05. විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අයවිය යුතු අතර වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

06. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02 ක් සහිතව විෂයයන් 06 කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

***සැ. යු.-*** අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවල දී, එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂයය කොටස් දෙකම සමත් නම් පමණක් විෂයය සමත් ලෙස සැලකිය යුතු ය.

07. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

08. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

09. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් "ඇමුණුම I" අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

10. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2026 අගෝස්තු මස 31 දින** හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

**එස්. ජලදීපන්,**
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2026 ජූලි මස 14 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යොමුකළ යුතු ලිපිනය* |
|---|---|---|---|
| මොණරාගල | මඩුල්ල | පොතුලියද්ද කොට්ඨාසයේ උප්පැන්න, මරණ සහ මඩුල්ල කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මොණරාගල |

07 - 486

## යුද්ධ හමුදා නිත්‍ය බල හමුදාව වෙත කෙඩෙට් නිලධාරි තනතුර සඳහා අයදුම්පත් කැඳවීම (කෙටිකාලීන කෙඩෙට් නිලධාරි පාඨමාලාව - ඩිප්ලෝමා)

1. ශ්‍රී ලංකා යුද්ධ හමුදා නිත්‍ය බල හමුදාවේ කෙඩෙට් නිලධාරි තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. තෝරාගනු ලබන අයදුම්කරුවන් ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨයේදී පුහුණු කරවනු ලැබේ.

2. ශ්‍රී ලංකාවේ පුහුණුවීම් කාලසීමාව සාර්ථක ලෙස නිම කිරීමෙන් පසුව විසිර යනු ලබන කෙඩෙට් නිලධාරීන්හට හමුදා අධ්‍යයන පිළිබඳ ඩිප්ලෝමාව පිරිනැමේ. ඔවුන් දෙවන ලුතිනන් වන ආරම්භක නිලයෙන් අධිකාරියට පත්කොට යෝග්‍යතාවයන් මෙන්ම ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ අවශ්‍යතාවයන් ද අනුව යුද්ධ හමුදා නිත්‍ය බල හමුදාවේ රෙජිමේන්තුවකට/බලකායකට ඇතුළත් කරනු ලැබේ.

3. මූලික සුදුසුකම්:

| | | |
|---|---|---|
| (අ) | පුරවැසිභාවය | : ශ්‍රී ලාංකික පිරිමි පුරවැසියෙකු විය යුතු යි. |
| (ආ) | විවාහක/අවිවාහක බව | : අවිවාහක. |
| (ඇ) | වයස | : 2026 ඔක්තෝබර් මස 01 දිනට වයස අවුරුදු 18 ත් 23 ත් අතර විය යුතු යි. |
| (ඈ) | උස | : අඩි 5 යි අඟල් 6 ට (167.5cm) නොඅඩු විය යුතු යි. |
| (ඉ) | බර | : කි.ග්‍රෑ. 52 (රාත්තල් 118) ට නොඅඩු විය යුතු යි. |
| (ඊ) | පපුව | : අඟල් 32 ට නොඅඩු විය යුතු යි. |
| (උ) | දෘෂ්ටි තීක්ෂණත්වය | : හුරු ඇස 6/6 විය යුතු ය ( උපැස් සහ කාච රහිතව). |
| (ඌ) | ශරීර ස්කන්ධ දර්ශකය | : 18.5 Kg/m$^2$ - 25 Kg/m$^2$ ත් අතර විය යුතු ය. |

4. අධ්‍යාපන සුදුසුකම්:

(අ) අ.පො.ස (උ/පෙළ) විභාගයෙන් තෙවරකට නොවැඩි වාර ගණනක දී එකවර විෂයයන් තුනක් (03) සමත්වීම (සාමාන්‍ය සාමාර්ථ S), සාමාන්‍ය පොදු පරීක්ෂණය සඳහා 30% ලකුණු ප්‍රතිශතයක් ලබා තිබීම හා විශ්වවිද්‍යාල ප්‍රවේශය “YES” ලෙස සඳහන්ව තිබීම;

*සහ*

(ආ) අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී එකවර විෂයයන් පහකට (05) සම්මාන සාමාර්ථ (C) සමග විෂයයන් අටක් (08) සමත්වීම (විද්‍යාව විෂයය ඇතුලුව) හා දෙවරකට නොවැඩි වාර ගණනක දී ඉංග්‍රීසි, ගණිතය හා සිංහල/දෙමළ විෂයයන් සඳහා සම්මාන සාමාර්ථ (C) ලබා තිබීම හෝ ඉංග්‍රීසි භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථ (S) පමණක් ලබා ඇති අයදුම්කරුවන් අ.පො.ස (උ/පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමාර්ථ (C) ලබා තිබීම හෝ NVQ Level 4 මට්ටමේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අධ්‍යාපන ආයතනයක් මගින් ඉංග්‍රීසි සඳහා උපාධි/ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම (NVQ සහතික පත්‍රය ඉදිරිපත් කළ යුතු ය);

*හෝ*

(ඇ) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පිළිගනු ලබන අ.පො.ස (සා/පෙළ) හා අ.පො.ස (උ/පෙළ) විභාග වලට සමාන ජාත්‍යන්තර විභාගයකින් (Pearson Edexcel, GCSE, GCE හා Cambridge හෝ වෙනත්) ඒ හා සමාන සාමාර්ථ ලබා තිබිය යුතු ය (ඉහත අනිවාර්යය විෂයයන් ද ඇතුලුව).

5. වෙනත් සුදුසුකම්. ජාත්‍යන්තර/ජාතික/පළාත්/දිස්ත්‍රික් මට්ටමින් ක්‍රීඩා, නායකත්ව, වෙනත් ජයග්‍රහණ සහ වෙනත් භාෂා (සිංහල හා ඉංග්‍රීසි හැර) හැසිරවීම විශේෂ සුදුසුකම් ලෙස සලකා බලනු ලැබේ.

6. පොදු:

(අ) පුහුණුවීම් ලබන කාලය තුළදී කෙඩෙට් නිලධාරීන්හට විවාහවීමට අවසර දෙනු නොලැබේ.
(ආ) මනා ශාරීරික සෞඛ්‍ය තත්වයේ සිටිය යුතුවේ. සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරාගනු ලබන සියලුම අයදුම්කරුවන් බඳවා ගැනීමට පෙර ශ්‍රී ලංකා යුද්ධ හමුදාව මගින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලබන අතර, ඉන් සමත් විය යුතු යි.

7. සේවා කොන්දේසි:

(අ) පුහුණු කාලසීමාව අවසානයේ සිට (අධිකාරියට පත්කරනු ලබන දිනයේ සිට) වසර 10 ක් අනිවාර්යයෙන්ම යුද්ධ හමුදා සේවයේ යෙදී සිටිය යුතු ය. ඒ සඳහා යුද්ධ හමුදාව සමඟ ඇපබැඳුම්කරයකට සහ ගිවිස්නාවකට යටත් කරනු ලැබේ.

(ආ) පුහුණුවීම ලබන කාලසීමාව තුළදී කෙඩෙට් නිලධාරියෙකුගේ මාසික වැටුප සියලු දීමනා සහිතව රු:105,415.80 කි. කෙඩෙට් නිලධාරියෙක් වශයෙන් සේවය කරන කාලය තුළ දී ඔවුන්හට කිසිදු වැටුප් වැඩිවීමකට හිමිකමක් නොමැත.

(ඇ) කෙඩෙට් නිලධාරීන්හට ශ්‍රී ලංකාවේ දී මාස 15ක කාලයක් යුද්ධ හමුදා විද්‍යාපීඨයේදී පුහුණුවීම්වල නිරත වීමට සිදු වේ.

(ඈ) පුහුණුවීමේ කාලය තුළ දී කෙඩෙට් නිලධාරින්ගේ තරාතිරම සෙසුනිලයින් හා සමාන වන අතර, ඔවුන් යුද්ධ හමුදා නීතියට සහ සිවිල් නීතියට යටත් වනු ඇත.

(ඉ) පාඨමාලාවෙන් ඉවත්වීම/ඉවත් කිරීම:

(1) පුහුණුවීම් කාලසීමාව තුළ දී කෙඩෙට් නිලධාරියෙකු සිය කැමැත්තෙන්ම අධිකාරිය සඳහා වූ තම අපේක්ෂකත්වය අවසන් කළහොත් එතෙක් එම කෙඩෙට් නිලධාරියා වෙනුවෙන් ශ්‍රී ලංකා ජනරජය මගින් දරන්නට යෙදුනු සියලුම වියදම භාරකරු හෝ ඇපකරුවන් විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට ආපසු ගෙවිය යුතු යි.

(2) කෙඩෙට් නිලධාරියෙකු පාඨමාලාවේ නියුතුව සිටින කාලය තුළ කිනම් අවස්ථාවක හෝ විෂමාචාර හේතූන් නිසා අස්කිරීම, තම අයහපත් ආරක්ෂක නිශ්කාෂන, තමන් විසින් වළක්වාලිය හැකි හේතූන් නිසා හෝ අධිකාරිය පිරිනැමීමට නුසුදුසු යැයි නිලධාරීන් විසින් වාර්තා කරනු ලැබුවහොත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය මගින් ඔහු වෙනුවෙන් දරන්නට යෙදුනු සියලුම වියදම් භාරකරු හෝ ඇපකරුවන් විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට ආපසු ගෙවිය යුතු යි.

(3) ඉල්ලා අස්වන ලද, ඉවත් කරන ලද හෝ වෛද්‍ය හේතූන් මත නුසුදුසු යැයි පුහුණුවෙන් ඉවත් කරන ලද කෙඩෙට් නිලධාරියෙකුට නැවත අවස්ථාවක යුද්ධ හමුදාව වෙත කෙඩෙට් නිලධාරියෙකු වශයෙන් බැඳීමට නොහැක.

8. වැටුප් හා දීමනා : ශ්‍රී ලංකා යුද්ධ හමුදා නිත්‍ය බල හමුදාවේ නිලධාරීන් වශයෙන් දෙවන ලුතිනන් වන ආරම්භක නිලයෙහි අධිකාරියට පත්කරනු ලැබීමේ දී, ඔවුන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිලධාරින්ට අදාළ වන පහත දැක්වෙන වැටුප් තලයෙහි/පරිමාණයෙහි තබනු ලැබේ:

| *අ: අ:* | *නිලය* | *කළමණාකරන සේවා චක්‍රලේඛ 05/2025 ට අනුව ඒකබද්ධ වැටුප* | | *වැටුප් වර්ධක* |
|---|---|---|---|---|
| | | *2026* | *2027* | |
| 1 | දෙවන ලුතිනන් | 60,709.00 | 65,880.00 | ස්ථිර |
| 2 | ලුතිනන් | 74,438.00 | 82,150.00 | 30x2400 |
| 3 | කපිතන් | 86,601.00 | 96,550.00 | 24x2400 |
| 4 | මේජර් | 94,710.00 | 106,150.00 | 22x2400 |
| 5 | ලුතිතන් කර්නල් | 97,192.00 | 109,090.00 | 17x2940 |
| 6 | කර්නල් | 117,857.00 | 133,570.00 | 17x3900 |
| 7 | බ්‍රිගේඩියර් | 124,446.00 | 141,370.00 | 15x3900 |
| 8 | මේජර් ජෙනරාල් | 136,575.00 | 156,000.00 | 12x4850 |
| 9 | ලුතිනන් ජෙනරාල් | 144,770.00 | 165,700.00 | 10x4850 |
| 10 | ජෙනරාල් | 157,063.00 | 180,250.00 | 7x4850 |

9. අනෙකුත් දීමනා : පහත සඳහන් මාසික දීමනා ගෙවනු ලැබේ:

(අ) සුදුසුකම් දීමනා,
(ආ) නොමිලේ ආහාර හෝ ආහාර දීමනාව,
(ඇ) ඇතුළත විසීමට නියෝග ලැබ සිටින විට වික්ෂේපණ දීමනාව (විවාහක නිලධාරින්ට පමණක්),
(ඈ) නිල ඇඳුම් නඩත්තු කිරීමේ දීමනාවක්.

10. පහත සඳහන් පහසුකම්/දීමනා ගෙවනු ලැබේ:

(අ) ඇතුළත විසීමට නියෝග ලැබ සිටින විට නොමිලේ නේවාසික පහසුකම්.
(ආ) කුලී නිවාසයක වාසය කරන විට ගෙවල් කුලී දීමනා.
(ඇ) නොමිලේ නිල ඇඳුම්.
(ඈ) විවාහක නිලධාරින්ට අනුගාමික දීමනා/අවිවාහක නිලධාරින් අනුගාමික සේවය.
(ඉ) ඇතුළත විසීමට නියෝග ලැබ සිටින නිලධාරින්ට රාජකාරී ස්ථානයේ සිට නිවස දක්වා මසකට වරක් රාජකාරී දුම්රිය බලපතක්.

11. වැටුප් හා ඉදිරි සේවා කොන්දේසි සම්බන්ධයෙන් පහත සඳහන් රෙගුලාසි නිලධාරින්ට බලපවත්වනු ලැබේ:

(අ) කළමණාකරන සේවා චක්‍රලේඛ 05/2025.

(ආ) යුද්ධ හමුදා වැටුප් සංග්‍රහය.

(ඇ) 1993 අගෝස්තු මස 17 වන දින අංක 780/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරනු ලැබූ කලින් කල සංශෝධිත 1992 යුද්ධ හමුදා නිලධාරි (නිත්‍ය බල හමුදා) සේවා නියෝගය.

(ඈ) 1989 ජුනි මස 15 වන දින අංක 562/11 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරනු ලැබූ කලින් කල සංශෝධිත 1981 යුද්ධ හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික ව්‍යවස්ථා සංග්‍රහය.

12. මෙහි පහත 13 වැනි ඡේදයෙහි දක්වා ඇති පරිදි දෙමව්පියන් හෝ භාරකරුවන් විසින් ප්‍රකාශන පත්‍රයකට අත්සන් කළයුතු වන අතර, එය අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කළයුතු වේ. තෝරාගත් අපේක්ෂකයින්ගේ දෙමව්පියන් හෝ භාරකරුවන් විසින් එකී අපේක්ෂකයින් පත් කිරීමට පෙර ප්‍රකාශන පත්‍රයෙහි අඩංගු කරුණුවලට අනුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයත් සමඟ ඇපබැඳුම්කරයකට අත්සන් කළ යුතු ය. විශේෂ අවස්ථාවලදී හැර පියා ජීවතුන් අතර සිටින කෙඩෙට් නිලධාරියෙකුගේ භාරකරු පියා විය යුතු අතර, ඔහු නොමැති නම් පමණක් මවට හෝ භාරකරුහට භාරකාරීත්වය හිමිවනු ලැබේ.

13. අයදුම්කරුගේ මව, පියා හෝ භාරකරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය:

(*අ*) ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ කෙඩෙට් නිලධාරි අයදුම්කරුවෙකු වන ..........ගේ පියා/මව/භාරකරු මම වෙමි.

(*ආ*) ශ්‍රී ලංකාවේදී හෝ විදේශයකදී පුහුණුවීමේ පාඨමාලාවක් හැදෑරීම සඳහා ඉහත නම සඳහන් අයදුම්කරු තෝරාගනු ලැබුවහොත් මෙහි පහත සඳහන් කරුණු සම්බන්ධ වගකීම මම භාර ගනිමි.

(1) පුහුණුවීමේ කාලසීමාව තුළදී අයදුම්කරුහට දරන්නට වන සියලුම පෞද්ගලික වියදම් දැරීමට,

(2) පුහුණුව ලබන කාලය තුළ ඉහත නම සඳහන් අයදුම්කරු සිය කැමැත්තෙන්ම අධිකාරිය අවසන් කළහොත්, ඔහු වෙනුවෙන් රජයට දැරීමට සිදු වූ සියලුම වියදම් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවීමට,

(3) පුහුණුව ලබන කාලය තුළ ඉහත නම සඳහන් අයදුම්කරු කිනම් අවස්ථාවක වුවත් (විෂමාචාරය හෝ ඔහුට තමන් විසින්ම වළක්වාලිය හැකි හේතූන් නිසා) අධිකාරිය ලැබීමට නුසුදුසු යැයි බලධාරීන් විසින් වාර්තා කරනු ලැබුවහොත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය මඟින් ඔහු වෙනුවෙන් දරන්නට වූ වැයකිරීම් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත ආපසු ගෙවීමට.

* නොගැලපෙන වචන කපා හරින්න.

............................................................,
මව/පියා/භාරකරුගේ අත්සන.

නම සහ ලිපිනය පැහැදිලි අකුරෙන්:..........................................................................................

දිනය :....................................

සාක්ෂිකරුගේ අත්සන :......................................

නම සහ ලිපිනය පැහැදිලි අකුරෙන් :..........................................................................................

14. භාෂා අවශ්‍යතා : ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහා විශේෂයෙන්ම වර්ෂ 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනත හා සංශෝධන ප්‍රකාරව විධිවිධාන ක්‍රියාවේ යෙදවීම සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට

මෙන්ම මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද අනුකූලව තෝරාගත් අයදුම්කරුවන් ක්‍රියා කළ යුතු වේ.

15. අනන්‍යතාවය තහවුරු කිරීම :

අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම පිණිස සාක්ෂි ඉදිරිපත් කිරීම අවශ්‍ය වනු ඇත. මේ සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් හෝ තැපැල්පති විසින් හෝ නිකුත් කරන ලද හැඳුනුම්පත සහ මෝටර් වාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද "රියදුරු බලපත්‍රය" පිළිගනු ලැබේ.

16. රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත්‍ර තෝරා ගතහොත් එම අයදුම්කරු මුදවාලිය හැකි බවට සහතිකයක්ද සහිතව දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවිය යුතු යි.

17. ඉල්ලුම් පත්‍ර :

ඉල්ලුම් පත්‍රය පහත දැක්වෙන ආකෘතියට අනුව අයදුම්කරුගේම අත් අකුරින් සම්පූර්ණකර 2026 ජූලි මස 31 දින 1200 පැයට හෝ ඊට පෙර ලැබෙන සේ "පිරිස් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය, ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, අකුරේගොඩ පාර, බත්තරමුල්ල'' යන ලිපිනයට එවිය යුතු වේ. ඉල්ලුම්පත්‍ර බහාලන කවරයේ වම් ඉහළ කෙලවරේ "යුද්ධ හමුදා නිත්‍ය බල හමුදාවේ කෙටි කාලීන කෙඩෙට් නිලධාරි පාඨමාලා අංක 26 (ඩිප්ලෝමා) පාඨමාලාවේ කෙඩෙට් නිලධාරි තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය'' යනුවෙන් සඳහන් කළ යුතු වේ. ඉල්ලුම් පත්‍ර භාරගනු ලබන අවසාන දිනයට පෙර හා වේලාවට පසුව සහ මෙම නිවේදනයේ දැක්වෙන අවශ්‍යතාවන්ට අනුකූල නොවන ඉල්ලුම් පත්‍ර භාරගනු නොලැබේ. මෙම මූලස්ථානය මගින් ඉල්ලුම් පත්‍ර නිකුත් කිරීමක්ද සිදුකරනු නොලැබේ. මේ පිළිබඳ වැඩිදුර විස්තර සහ අයදුම්පත www.army.lk/officers වෙබ් අඩවියෙන් ලබා ගත හැක.

18. ඉල්ලුම් පත්‍ර සමග පහත සඳහන් සහතිකපත්හි ඡායා පිටපත් එවිය යුතු ය:

(අ) උප්පැන්න සහතිකය.
(ආ) ඉදිරිපත්කර ඇති අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීමේ සහතික.
(ඇ) ක්‍රීඩා හා විෂය සමගාමී ක්‍රියාකාරකම් පිළිබඳ සහතික.
(ඈ) තව ද, ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්ද මෑතක දී ලබාගත් 2'' x 2½'' ප්‍රමාණයේ නිල් පසුබිම සහිත වර්ණ ඡායාරූපයක් ග්‍රාම නිලධාරි හෝ නීතිඥවරයෙකු විසින් සහතිකකර එවිය යුතු ය.

19. සම්මුඛ පරීක්ෂණයන් පැවැත්වීම :

ඉහත සඳහන් අවශ්‍යතාවයන් සපුරාලන අයදුම්කරුවන් මූලික තේරීම්වලට භාජනය කරනු ලැබේ. එසේ තෝරාගනු ලබන අයදුම්කරුවන් යුද්ධ හමුදාධිපති විසින් නියම කරනු ලබන පරිදි පරීක්ෂණ වලට පෙනී සිටිය යුතු යි. එම පරීක්ෂණයන්ගෙන් තෝරාගනු ලබන අයදුම්කරුවන් ආරක්ෂක අමාත්‍යාංශය මඟින් පත්කරනු ලබන තේරීම් මණ්ඩලයක් ඉදිරිපිට සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අවසාන තේරීම් කරනු ලැබේ.

20. තේරීම් මණ්ඩලය මගින් සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන්ට සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන ස්ථානය, වේලාව සහ දිනය විද්‍යුත් ලිපියක් මඟින් දැනුම් දෙනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය පිරිස් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය, ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, අකුරේගොඩ පාර, බත්තරමුල්ල හිදී පැවැත්වීමට කටයුතු සිදුකරනු ලබන අතර, අයදුම්කරුවන් දරනු ලබන ගමන් වියදම් හෝ වෙනත් වියදම් කිසිවක් ශ්‍රී ලංකා ජනරජය මඟින් ආපසු ගෙවනු නොලැබේ.

21. අයදුම්කරුවෙකු නිර්දේශ කිරීමට අදහස් කරන කවරෙකු විසින් වුවද එසේ කළ යුත්තේ ඔහුට සහතිකයක් දීමෙනි. අයදුම්කරුවෙකු තෝරා ගැනීම සඳහා කවරාකාරයකින් හෝ පෙළඹවීම නැතහොත් බලපෑම් කිරීමට උත්සහ දැරීම අපේක්ෂකයා නුසුදුස්සෙකු වනු ඇත.

22. බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අයදුම්කරුවන් වෙත ඒ බව දන්වනු නොලැබේ. එවැනි අයදුම්කරුවන්ගෙන් ඒ පිළිබඳ කරුණු සැලකිරීම භාරගනු නොලැබේ.

*සටහන:* මෙම *ගැසට්* නිවේදනය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන්ම පළ වේ. සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

**බී කේ ජී එම් එල් රොද්‍රිගෝ**
ආර්එස්පී සීටීඑෆ්-එන්ඩීයූ පීඑස්සී අයිජී,
ලුතිනන් ජෙනරාල්,
යුද්ධ හමුදාධිපති.

2026 මාර්තු මස 25 දින,
ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය,
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,
අකුරේගොඩ පාර,
බත්තරමුල්ල.

07 - 491/1

**යුද්ධ හමුදා නිත්‍ය බල හමුදාව වෙත කාන්තා කෙඩෙට් නිලධාරි තනතුර සඳහා අයදුම්පත් කැඳවීම**
**(කාන්තා කෙඩෙට් නිලධාරි පාඨමාලාව - ඩිප්ලෝමා)**

1. ශ්‍රී ලංකා යුද්ධ හමුදා නිත්‍ය බල හමුදාවේ කාන්තා කෙඩෙට් නිලධාරි තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. තෝරාගනු ලබන අයදුම්කරුවන් ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨයේදී පුහුණු කරවනු ලැබේ.

2. ශ්‍රී ලංකාවේ පුහුණුවීම් කාලසීමාව සාර්ථක ලෙස නිම කිරීමෙන් පසුව විසිර යනු ලබන කාන්තා කෙඩෙට් නිලධාරීන්හට **හමුදා අධ්‍යයන පිළිබඳ ඩිප්ලෝමාව පිරිනැමේ.** ඔවුන් **දෙවන ලුතිනන්** වන ආරම්භක නිලයෙන් අධිකාරියට පත්කොට යෝග්‍යතාවයන් මෙන්ම ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ අවශ්‍යතාවයන් ද අනුව යුද්ධ හමුදා නිත්‍ය බල හමුදාවේ රෙජිමේන්තුවකට/බලකායකට ඇතුළත් කරනු ලැබේ.

3. **මූලික සුදුසුකම්:**

| | | |
|---|---|---|
| (අ) | පුරවැසිභාවය | : ශ්‍රී ලාංකික කාන්තා පුරවැසියෙකු විය යුතු යි. |
| (ආ) | විවාහක/අවිවාහක බව | : අවිවාහක. |
| (ඇ) | වයස | : 2026 ඔක්තෝබර් මස 01 දිනට වයස අවුරුදු 18 ත් 22 ත් අතර විය යුතු යි. |
| (ඈ) | උස | : අඩි 5 යි අඟල් 3 ට (162 cm) නොඅඩු විය යුතු යි. |
| (ඉ) | බර | : කි.ග්‍රෑ. 45 (රාත්තල් 99 ) ට නොඅඩු විය යුතු යි. |
| (ඊ) | දෘෂ්ටි තීක්ෂණත්වය | : 6/6 විය යුතුය ( උපැස් සහ කාච රහිතව). |
| (උ) | ශරීර ස්කන්ධ දර්ශකය | : 18.5 $Kg/m^2$ - 25 $Kg/m^2$ ත් අතර විය යුතු ය. |

4. **අධ්‍යාපන සුදුසුකම්:**

(අ) අ.පො.ස (උ/පෙළ) විභාගයෙන් තෙවරකට නොවැඩි වාර ගණනකදී එකවර විෂයයන් තුනක් (03) සමත්වීම (සාමාන්‍ය සාමාර්ථ S), සාමාන්‍ය පොදු පරීක්ෂණය සඳහා 30% ලකුණු ප්‍රතිශතයක් ලබා තිබීම හා විශ්වවිද්‍යාල ප්‍රවේශය “YES” ලෙස සඳහන්ව තිබීම

*සහ*

(ආ) අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී එකවර විෂයයන් පහකට (05) සම්මාන සාමාර්ථ (C) සමග විෂයන් අටක් (08) සමත්වීම (විද්‍යාව විෂය ඇතුළුව) හා දෙවරකට නොවැඩි වාර ගණනක දී ඉංග්‍රීසි, ගණිතය හා සිංහල/දෙමළ විෂයයන් සඳහා සම්මාන සාමාර්ථ (C) ලබා තිබීම හෝ ඉංග්‍රීසි භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථ (S) පමණක් ලබා ඇති අයදුම්කාරිනියන් අ.පො.ස (උ/පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමාර්ථ (C) ලබා තිබීම හෝ NVQ Level ) 4 මට්ටමේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අධ්‍යාපන ආයතනයක් මගින් ඉංග්‍රීසි සඳහා උපාධි/ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම (NVQ සහතික පත්‍රය ඉදිරිපත් කළ යුතුය)

*හෝ*

(ඇ) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පිළිගනු ලබන අ.පො.ස (සා/පෙළ) හා අ.පො.ස (උ/පෙළ) විභාග වලට සමාන ජාත්‍යන්තර විභාගයකින් (Pearson Edexcel, GCSE, GCE හා Cambridge හෝ වෙනත්) ඒ හා සමාන සාමාර්ථ ලබා තිබිය යුතුය (ඉහත අනිවාර්යය විෂයයන් ද ඇතුළුව).

5. **වෙනත් සුදුසුකම්.** ජාත්‍යන්තර/ජාතික/පළාත්/දිස්ත්‍රික් මට්ටමින් ක්‍රීඩා, නායකත්ව, වෙනත් ජයග්‍රහණ සහ වෙනත් භාෂා (සිංහල හා ඉංග්‍රීසි හැර) හැසිරවීම විශේෂ සුදුසුකම් ලෙස සලකා බලනු ලැබේ.

6. **පොදු:**

(අ) පුහුණුවීම් ලබන කාලය තුළදී කාන්තා කෙඩෙට් නිලධාරින්හට විවාහවීමට අවසර දෙනු නොලැබේ.

(ආ) මනා ශාරීරික සෞඛ්‍ය තත්වයේ සිටිය යුතු වේ. සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරාගනු ලබන සියලුම අයඳුම්කාරිනියන් බඳවා ගැනීමට පෙර ශ්‍රී ලංකා යුද්ධ හමුදාව මගින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලබන අතර, ඉන් සමත් විය යුතු යි.

7. **සේවා කොන්දේසි:**

(අ) පුහුණු කාලසීමාව අවසානයේ සිට (අධිකාරියට පත්කරනු ලබන දිනයේ සිට) වසර 10 ක් අනිවාර්යයෙන්ම යුද්ධ හමුදා සේවයේ යෙදී සිටිය යුතුය. ඒ සඳහා යුද්ධ හමුදාව සමඟ ඇපබැඳුම්කරයකට සහ ගිවිස්නාවකට යටත් කරනු ලැබේ.

(ආ) පුහුණුවීම ලබන කාලසීමාව තුළදී කාන්තා කෙඩෙට් නිලධාරියෙකුගේ මාසික වැටුප සියලු දීමනා සහිතව රු:105,415.80 කි. කාන්තා කෙඩෙට් නිලධාරියෙක් වශයෙන් සේවය කරන කාලය තුළදී ඔවුන්හට කිසිදු වැටුප් වැඩිවීමකට හිමිකමක් නොමැත.

(ඇ) කාන්තා කෙඩෙට් නිලධාරීන් හට ශ්‍රී ලංකාවේදී මාස 15ක කාලයක් යුද්ධ හමුදා විද්‍යාපීඨයේදී පුහුණුවීම්වල නිරත වීමට සිදුවේ.

(ඈ) පුහුණුවීමේ කාලය තුලදී කාන්තා කෙඩෙට් නිලධාරීන්ගේ තරාතිරම සෙසු නිලයින් හා සමාන වන අතර, ඔවුන් යුද්ධ හමුදා නීතියට සහ සිවිල් නීතියට යටත් වනු ඇත.

(ඉ) **පාඨමාලාවෙන් ඉවත්වීම/ඉවත් කිරීම:**

(1) පුහුණුවීම් කාලසීමාව තුළදී කාන්තා කෙඩෙට් නිලධාරියෙකු සිය කැමැත්තෙන්ම අධිකාරිය සඳහා වූ තම අපේක්ෂකත්වය අවසන් කළහොත් එතෙක් එම කාන්තා කෙඩෙට් නිලධාරි වෙනුවෙන් ශ්‍රී ලංකා ජනරජය මගින් දරන්නට යෙදුනු සියලුම වියදම භාරකරු හෝ ඇපකරුවන් විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට ආපසු ගෙවිය යුතු යි.

(2) කාන්තා කෙඩෙට් නිලධාරියෙකු පාඨමාලාවේ නියුතුව සිටින කාලය තුළ කිනම් අවස්ථාවක හෝ විෂමාචාර හේතූන් නිසා අස්කිරීම, තම අයහපත් ආරක්ෂක නිශ්කාෂන, තමන් විසින් වලක්වාලිය හැකි හේතූන් නිසා හෝ අධිකාරිය පිරිනැමීමට නුසුදුසු යැයි නිලධාරීන් විසින් වාර්තා කරනු ලැබුවහොත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය මගින් ඇය වෙනුවෙන් දරන්නට යෙදුනු සියලුම වියදම් භාරකරු හෝ ඇපකරුවන් විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට ආපසු ගෙවිය යුතුයි.

(3) ඉල්ලා අස්වන ලද, ඉවත් කරන ලද හෝ වෛද්‍ය හේතූන් මත නුසුදුසු යැයි පුහුණුවෙන් ඉවත් කරන ලද කාන්තා කෙඩෙට් නිලධාරියෙකුට නැවත අවස්ථාවක යුද්ධ හමුදාව වෙත කාන්තා කෙඩෙට් නිලධාරියෙක් වශයෙන් බැඳීමට නොහැක.

8. **වැටුප් හා දීමනා.** ශ්‍රී ලංකා යුද්ධ හමුදා නිත්‍ය බල හමුදාවේ නිලධාරිනියන් වශයෙන් දෙවන ලුතිනන් වන ආරම්භක නිලයෙහි අධිකාරියට පත්කරනු ලැබීමේ දී, ඔවුන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිලධාරීන්ට අදාළ වන පහත දැක්වෙන වැටුප් තලයෙහි/පරිමාණයෙහි තබනු ලැබේ:

| *අ: අ:* | *නිලය* | *කළමණාකරන සේවා චක්‍රලේඛ 05/2025 ට අනුව ඒකාබද්ධ වැටුප* | | *වැටුප් වර්ධක* |
|---|---|---|---|---|
| | | *2026* | *2027* | |
| 1 | දෙවන ලුතිනන් | 60,709.00 | 65,880.00 | ස්ථිර |
| 2 | ලුතිනන් | 74.,438.00 | 82,150.00 | 30x2400 |
| 3 | කපිතන් | 86,601.00 | 96,550.00 | 24x2400 |
| 4 | මේජර් | 94,710.00 | 106,150.00 | 22x2400 |
| 5 | ලුතිතන් කර්නල් | 97,192.00 | 109,090.00 | 17x2940 |
| 6 | කර්නල් | 117,857.00 | 133,570.00 | 17x3900 |
| 7 | බ්‍රිගේඩියර් | 124,446.00 | 141,370.00 | 15x3900 |
| 8 | මේජර් ජෙනරාල් | 136,575.00 | 156,000.00 | 12x4850 |
| 9 | ලුතිනන් ජෙනරාල් | 144,770.00 | 165,700.00 | 10x4850 |
| 10 | ජෙනරාල් | 157,063.00 | 180,250.00 | 7x4850 |

9. **අනෙකුත් දීමනා.** පහත සඳහන් මාසික දීමනා ගෙවනු ලැබේ:

(අ) සුදුසුකම් දීමනා.
(ආ) නොමිලේ ආහාර හෝ ආහාර දීමනාව.
(ඇ) ඇතුළත විසීමට නියෝග ලැබ සිටින විට වික්ෂේපණ දීමනාව (විවාහක නිලධාරිනියන්ට පමණක්).
(ඈ) නිල ඇඳුම් නඩත්තු කිරීමේ දීමනාවක්.

10. පහත සඳහන් පහසුකම්/දීමනා ගෙවනු ලැබේ:

(අ) ඇතුළත විසීමට නියෝග ලැබ සිටින විට නොමිලේ නේවාසික පහසුකම්.
(ආ) කුලී නිවාසයක වාසය කරන විට ගෙවල් කුලී දීමනා.
(ඇ) නොමිලේ නිල ඇඳුම්.

(*ඇ*) විවාහක නිලධාරිනියන් හට අනුගාමික දීමනා/අවිවාහක නිලධාරිනියන් අනුගාමික සේවය.
(*ඉ*) ඇතුළත විසීමට නියෝග ලැබ සිටින නිලධාරිනියන් හට රාජකාරී ස්ථානයේ සිට නිවස දක්වා මසකට වරක් රාජකාරී දුම්රිය බලපතක්.

11. **වැටුප් හා ඉදිරි සේවා කොන්දේසි සම්බන්ධයෙන් පහත සඳහන් රෙගුලාසි නිලධාරිනියන් හට බලපවත්වනු ලැබේ:**

(*අ*) කළමණාකරන සේවා චක්‍රලේඛ 05/2025.

(*ආ*) යුද්ධ හමුදා වැටුප් සංග්‍රහය.

(*ඇ*) 1993 අගෝස්තු මස 17 වන දින අංක 780/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරනු ලැබූ කලින් කල සංශෝධිත 1992 යුද්ධ හමුදා නිලධාරි (නිත්‍ය බල හමුදා) සේවා නියෝගය.

(*ඈ*) 1989 ජූනි මස 15 වන දින අංක 562/11 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරනු ලැබූ කලින් කල සංශෝධිත 1981 යුද්ධ හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික ව්‍යවස්ථා සංග්‍රහය.

12. මෙහි පහත 13 වැනි ඡේදයෙහි දක්වා ඇති පරිදි දෙමව්පියන් හෝ භාරකරුවන් විසින් ප්‍රකාශන පත්‍රයකට අත්සන් කළයුතු වන අතර, එය අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කළයුතු වේ. තෝරාගත් අපේක්ෂිකාවන්ගේ දෙමව්පියන් හෝ භාරකරුවන් විසින් එකී අපේක්ෂිකාවන් පත් කිරීමට පෙර ප්‍රකාශන පත්‍රයෙහි අඩංගු කරුණු වලට අනුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයත් සමග ඇපබැඳුම්කරයකට අත්සන් කළ යුතු ය. විශේෂ අවස්ථා වල දී හැර පියා ජීවතුන් අතර සිටින කාන්තා කෙඩෙට් නිලධාරියෙකුගේ භාරකරු පියා විය යුතු අතර, ඔහු නොමැති නම් පමණක් මවට හෝ භාරකරුහට භාරකාරීත්වය හිමිවනු ලැබේ.

13. **අයදුම්කාරියගේ මව, පියා හෝ භාරකරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය:**

(*අ*) ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ කාන්තා කෙඩෙට් නිලධාරි අයදුම්කාරිනියක වන ..........ගේ පියා/මව/භාරකරු මම වෙමි.

(*ආ*) ශ්‍රී ලංකාවේ දී හෝ විදේශයකදී පුහුණුවීමේ පාඨමාලාවක් හැදෑරීම සඳහා ඉහත නම සඳහන් අයදුම්කාරිය තෝරාගනු ලැබුවහොත් මෙහි පහත සඳහන් කරුණු සම්බන්ධ වගකීම මම භාර ගනිමි.

(1) පුහුණුවීමේ කාලසීමාව තුළදී අයදුම්කාරියහට දරන්නට වන සියලුම පෞද්ගලික වියදම් දැරීමට.

(2) පුහුණුව ලබන කාලය තුළ ඉහත නම සඳහන් අයදුම්කාරිය සිය කැමැත්තෙන්ම අධිකාරිය අවසන් කළහොත්, ඇය වෙනුවෙන් රජයට දැරීමට සිදුවූ සියලුම වියදම් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවීමට.

(3) පුහුණුව ලබන කාලය තුළ ඉහත නම සඳහන් අයදුම්කාරිය කිනම් අවස්ථාවක වුවත් (විෂමාචාරය හෝ ඇයට තමන් විසින්ම වලක්වාලිය හැකි හේතූන් නිසා) අධිකාරිය ලැබීමට නුසුදුසු යැයි බලධාරින් විසින් වාර්තා කරනු ලැබුවහොත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය මගින් ඇය වෙනුවෙන් දරන්නට වූ වැයකිරීම් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත ආපසු ගෙවීමට.

*නොගැලපෙන වචන කපා හරින්න.

.............................................,
මව/පියා/භාරකරුගේ අත්සන.

නම සහ ලිපිනය පැහැදිලි අකුරෙන්:.........................................................................................
දිනය :....................................
සාක්ෂිකරුගේ අත්සන :.......................................
නම සහ ලිපිනය පැහැදිලි අකුරෙන් :.........................................................................................

14. **භාෂා අවශ්‍යතා.-** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහා විශේෂයෙන්ම වර්ෂ 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනත හා සංශෝධන ප්‍රකාරව විධිවිධාන ක්‍රියාවේ යෙදවීම සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන්ම මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද අනුකූලව තෝරාගත් අයදුම්කාරිනියන් ක්‍රියා කළ යුතු වේ.

15. **අනන්‍යතාවය තහවුරු කිරීම.- අයදුම්කාරිනියන් විසින් ඔවුන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම පිණිස සාක්ෂි ඉදිරිපත් කිරීම අවශ්‍ය වනු ඇත. මේ සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් හෝ තැපැල්පති විසින් හෝ නිකුත් කරන ලද හැඳුනුම්පත සහ මෝටර් වාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද** "රියදුරු බලපත්‍රය" පිළිගනු ලැබේ.

16. රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කාරිනියන්ගේ ඉල්ලුම්පත්‍ර තෝරා ගතහොත් එම අයදුම්කාරිනිය මුදාවාලිය හැකි බවට සහතිකයක්ද සහිතව දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවිය යුතු යි.

17. **ඉල්ලුම් පත්‍ර.-** ඉල්ලුම් පත්‍රය පහත දැක්වෙන ආකෘතියට අනුව අයදුම්කාරිනියගේම අත් අකුරින් සම්පූර්ණ කර 2026 ජූලි මස 31 දින 1200 පැයට හෝ ඊට පෙර ලැබෙන සේ **''පිරිස් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය, ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, අකුරේගොඩ පාර, බත්තරමුල්ල"** යන ලිපිනයට එවිය යුතුවේ. ඉල්ලුම්පත්‍ර බහාලන කවරයේ වම් ඉහළ කෙලවරේ **''යුද්ධ හමුදා නිත්‍ය බල හමුදාවේ කාන්තා කෙඩෙට් නිලධාරි (ඩිප්ලෝමා) පාඨමාලාවේ කාන්තා කෙඩෙට් නිලධාරි තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය"** යනුවෙන් සඳහන් කළ යුතුවේ. ඉල්ලුම් පත්‍ර භාරගනු ලබන අවසාන දිනයට පෙර හා වේලාවට පසුව සහ මෙම නිවේදනයේ දැක්වෙන අවශ්‍යතාවන්ට අනුකූල නොවන ඉල්ලුම් පත්‍ර භාරගනු නොලැබේ. මෙම මූලස්ථානය මගින් ඉල්ලුම් පත්‍ර නිකුත් කිරීමක්ද සිදුකරනු නොලැබේ. මේ පිළිබඳ වැඩිදුර විස්තර සහ අයදුම්පත www.army.lk/officers වෙබ් අඩවියෙන් ලබා ගත හැක.

18. **ඉල්ලුම් පත්‍ර සමග පහත සඳහන් සහතිකපත්හි ඡායා පිටපත් එවිය යුතු ය:**

(අ) උප්පැන්න සහතිකය.
(ආ) ඉදිරිපත්කර ඇති අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීමේ සහතික.
(ඇ) ක්‍රීඩා හා විෂය සමගාමී ක්‍රියාකාරකම් පිළිබඳ සහතික.
(ඈ) තවද, ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්ද මෑතකදී ලබාගත් 2" x 2½" ප්‍රමාණයේ නිල් පසුබිම සහිත වර්ණ ඡායාරූපයක් ග්‍රාම නිලධාරි හෝ නීතිඥවරයෙකු විසින් සහතිකකර එවිය යුතු ය.

19. **සම්මුඛ පරීක්ෂණයන් පැවැත්වීම.- ඉහත සඳහන් අවශ්‍යතාවයන් සපුරාලන අයදුම්කාරිනියන් මූලික තේරීම් වලට භාජනය කරනු ලැබේ. එසේ තෝරාගනු ලබන අයදුම්කාරිනියන් යුද්ධ හමුදාධිපති විසින් නියම කරනු ලබන පරිදි පරීක්ෂණ වලට පෙනී සිටිය යුතුයි. එම පරීක්ෂණයන්ගෙන් තෝරාගනු ලබන අයදුම්කාරිනියන් ආරක්ෂක අමාත්‍යාංශය මගින් පත්කරනු ලබන තේරීම් මණ්ඩලයක් ඉදිරිපිට සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අවසාන තේරීම් කරනු ලැබේ.**

20. තේරීම් මණ්ඩලය මගින් සම්මුඛ පරීක්ෂය සඳහා තෝරාගනු ලබන අයදුම්කාරිනියන් හට සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන ස්ථානය, වේලාව සහ දිනය විද්‍යුත් ලිපියක් මගින් දැනුම් දෙනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය **පිරිස් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය, ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, අකුරේගොඩ පාර, බත්තරමුල්ල හිදී පැවැත්වීමට කටයුතු සිදුකරනු ලබන අතර, අයදුම්කාරිනියන් දරනු ලබන ගමන් වියදම් හෝ වෙනත් වියදම් කිසිවක් ශ්‍රී ලංකා ජනරජය මගින් ආපසු ගෙවනු නොලැබේ.**

21. අයදුම්කාරිනියක නිර්දේශ කිරීමට අදහස් කරන කවරෙකු විසින් වුවද එසේ කළ යුත්තේ ඇයට සහතිකයක් දීමෙනි. අයදුම්කාරිනියක තෝරා ගැනීම සඳහා කවරාකාරයකින් හෝ පෙළඹවීම නැතහොත් බලපෑම් කිරීමට උත්සහ දැරීම අපේක්ෂිකාව නුසුදුස්සෙකු වනු ඇත.

22. බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අයදුම්කාරිනියන් වෙත ඒ බව දන්වනු නොලැබේ. එවැනි අයදුම්කාරිනියන්ගෙන් ඒ පිළිබඳ කරුණු සැලකිරීම භාරගනු නොලැබේ.

**සටහන: මෙම *ගැසට්* නිවේදනය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන්ම පළවේ. සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.**

**බී කේ ජී එම් එල් රොද්‍රිගෝ**
ආර්එස්පී සීටීඑෆ්-එන්ඩීයූ පීඑස්සී අයිජී,
ලුතිනන් ජෙනරාල්,
යුද්ධ හමුදාධිපති.

2026 මාර්තු මස 25 දින,
ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය,
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,
අකුරේගොඩ පාර,
බත්තරමුල්ල.

07 - 491/2

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

සිංහල මාධ්‍ය උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරු

**නුවරඑළිය දිස්ත්‍රික්කය**

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ / අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ:-

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ / අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර වැටුප් නොලබන සේවාවක් වන අතර, ඒ සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය.

04. විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 65 වන අතර, වයස අවුරුදු 65-70 දක්වා රෙජිස්ට්‍රාර්වරයාගේ රාජකාරි ඉටු කිරීමේ ස්වභාවය, කායික හා මානසික යෝග්‍යතාව අනුව වසරින් වසර සේවය දීර්ඝ කිරීම සිදු කෙරේ. එලෙස සේවය දීර්ඝ නොකරන ඕනෑම අවස්ථාවක අදාළ රෙජිස්ට්‍රාර්වරයාගේ සේවය අවසන් කරනු ලැබේ.

05. විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අයවිය යුතු අතර වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

06. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02 ක් සහිතව විෂයයන් 06 කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

***සැ. යු.-*** අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවල දී, එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂයය කොටස් දෙකම සමත් නම් පමණක් විෂයය සමත් ලෙස සැලකිය යුතු ය.

07. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

08. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

09. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් "ඇමුණුම I" අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

10. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2026 අගෝස්තු මස 31 දින** හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

**එස්. ජලදීපන්,**
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2026 ජූලි මස 20 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| නුවරඑළිය | වලපනේ | වලපනේ කොට්ඨාසයේ අතිරේක විවාහ (උඩරට/ සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, නුවරඑළිය |
| නුවරඑළිය | වලපනේ | වලපනේ ඔයපළාත කොට්ඨාසයේ අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, නුවරඑළිය |
| නුවරඑළිය | අඹගමුව | අඹගමුව උතුර කොට්ඨාසයේ අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, නුවරඑළිය |

07 - 530

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

සිංහල මාධ්‍ය උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු

**නුවරඑළිය දිස්ත්‍රික්කය**

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර වැටුප් නොලබන සේවාවක් වන අතර ඒ සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය.

04. විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 65 වන අතර වයස අවුරුදු 65-70 දක්වා රෙජිස්ට්‍රාර්වරයාගේ රාජකාරි ඉටු කිරීමේ ස්වභාවය, කායික හා මානසික යෝග්‍යතාව අනුව වසරින් වසර සේවය දීර්ඝ කිරීම සිදු කෙරේ. එලෙස සේවය දීර්ඝ නොකරන ඕනෑම අවස්ථාවක අදාළ රෙජිස්ට්‍රාර්වරයාගේ සේවය අවසන් කරනු ලැබේ.

05. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරී කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02 ක් සහිතව විෂයයන් 06 කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

***සැ. යු.***- අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවල දී, එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂයය කොටස් දෙකම සමත් නම් පමණක් විෂය සමත් ලෙස සැලකිය යුතු ය.

06. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.
රෝහල් කොට්ඨාසයක උප්පැන්න, රෙජිස්ට්‍රාර්ධුරයකට බඳවා ගැනීමේ දී අයදුම්කරුවන්ට රජයේ රෝහල තුළ ප්‍රමාණවත් කාර්යාල පහසුකම් නොලැබෙන අවස්ථාවක රෝහලට කි. මී. 01ක් පමණ නුදුරින් කොට්ඨාසය තුළ පිහිටි සුදුසු වෙනත් ගොඩනැගිල්ලක තම කාර්යාලය පිහිටුවීමට හැකි විය යුතු ය.

07. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

08. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් "ඇමුණුම I" අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

09. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2026 අගෝස්තු මස 31 දින** හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

**එස්. ජලදීපන්,**
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2026 ජූලි මස 20 දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| නුවරඑළිය | අඹගමුව | හැටන් - දික්ඔය කොට්ඨාසයේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, නුවරඑළිය |
| නුවරඑළිය | නුවරඑළිය | තලවකැලේ ලිඳුල කොට්ඨාසයේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, නුවරඑළිය |

07 - 531

---

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

සිංහල මාධ්‍ය උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරු

**මහනුවර දිස්ත්‍රික්කය**

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ / අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ:-

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ / අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර වැටුප් නොලබන සේවාවක් වන අතර, ඒ සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය.

04. විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 65 වන අතර, වයස අවුරුදු 65-70 දක්වා රෙජිස්ට්‍රාර්වරයාගේ රාජකාරි ඉටු කිරීමේ ස්වභාවය, කායික හා මානසික යෝග්‍යතාව අනුව වසරින් වසර සේවය දීර්ඝ කිරීම සිදු කෙරේ. එලෙස සේවය දීර්ඝ නොකරන ඕනෑම අවස්ථාවක අදාළ රෙජිස්ට්‍රාර්වරයාගේ සේවය අවසන් කරනු ලැබේ.

05. විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අයවිය යුතු අතර වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

06. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02 ක් සහිතව විෂයයන් 06 කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

*සැ. යු.-* අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවල දී, එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂයය කොටස් දෙකම සමත් නම් පමණක් විෂයය සමත් ලෙස සැලකිය යුතු ය.

07. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

08. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

09. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් "ඇමුණුම I" අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

10. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2026 අගෝස්තු මස 31** දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

**එස්. ජලදීපන්,**
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2026 ජූලි මස 20 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| මහනුවර | උඩපළාත | කඳුකර ඉහළ නැගෙනහිර කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා උඩපළාත කොට්ඨාසයේ විවාහ (උඩරට/ සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර |
| මහනුවර | යටිනුවර | උඩුනුවර - යටිනුවර කොට්ඨාසයේ අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර |

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| මහනුවර | කඩවත්සතර හා ගඟවට කෝරළය | කඩවත්සතර හා ගඟවට කෝරළය කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා මහනුවර නගරය කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර |
| මහනුවර | පස්බාගේ කෝරළේ | පස්බාගේ කෝරළේ කොට්ඨාසයේ අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර |
| මහනුවර | උඩපළාත | උඩපළාත කොට්ඨාසයේ සිංහාපිටිය ප්‍රදේශයේ අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර |
| මහනුවර | උඩුනුවර | වතුපොල ප්‍රදේශයේ අතිරේක විවාහ (උඩරට/ සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර |
| මහනුවර | උඩුනුවර | උඩුනුවර හා යටිනුවර (වැලිගල්ල) කොට්ඨාසයේ අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර |
| මහනුවර | පාතහේවාහැට | පාතහේවාහැට කොට්ඨාසයේ අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර |

07 - 532

---

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

සිංහල මාධ්‍ය උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු

**මහනුවර දිස්ත්‍රික්කය**

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර වැටුප් නොලබන සේවාවක් වන අතර ඒ සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය.

04. විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 65 වන අතර වයස අවුරුදු 65-70 දක්වා රෙජිස්ට්‍රාර්වරයාගේ රාජකාරි ඉටු කිරීමේ ස්වභාවය, කායික හා මානසික යෝග්‍යතාව අනුව වසරින් වසර සේවය දීර්ඝ කිරීම සිදු කෙරේ. එලෙස සේවය දීර්ඝ නොකරන ඕනෑම අවස්ථාවක අදාළ රෙජිස්ට්‍රාර්වරයාගේ සේවය අවසන් කරනු ලැබේ.

05. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02 ක් සහිතව විෂයයන් 06 කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.
***සැ. යු.-*** අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවල දී, එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂයය කොටස් දෙකම සමත් නම් පමණක් විෂය සමත් ලෙස සැලකිය යුතු ය.

06. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.
රෝහල් කොට්ඨාසයක උප්පැන්න, රෙජිස්ට්‍රාර්ධුරයකට බඳවා ගැනීමේ දී අයදුම්කරුවන්ට රජයේ රෝහල තුළ ප්‍රමාණවත් කාර්යාල පහසුකම් නොලැබෙන අවස්ථාවක රෝහලට කි. මී. 01ක් පමණ නුදුරින් කොට්ඨාසය තුළ පිහිටි සුදුසු වෙනත් ගොඩනැගිල්ලක තම කාර්යාලය පිහිටුවීමට හැකි විය යුතු ය.

07. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

08. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් "ඇමුණුම I" අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

09. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2026 අගෝස්තු මස 31 දින** හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

**එස්. ජලදීපන්,**
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2026 ජූලි මස 26 දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| මහනුවර | කඩවත්සතර හා ගඟවට කෝරළය | කටුගස්තොට කොට්ඨාසයේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර |

07 - 533

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

දෙමළ මාධ්‍ය උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු

**මහනුවර දිස්ත්‍රික්කය**

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ:

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර වැටුප් නොලබන සේවාවක් වන අතර, ඒ සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය.

04. විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 65 වන අතර වයස අවුරුදු 65-70 දක්වා රෙජිස්ට්‍රාර්වරයාගේ රාජකාරි ඉටු කිරීමේ ස්වභාවය, කායික හා මානසික යෝග්‍යතාව අනුව වසරින් වසර සේවය දීර්ඝ කිරීම සිදු කෙරේ. එලෙස සේවය දීර්ඝ නොකරන ඕනෑම අවස්ථාවක අදාළ රෙජිස්ට්‍රාර්වරයාගේ සේවය අවසන් කරනු ලැබේ.

05. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනක දී දෙමළ භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02 ක් සහිතව විෂයයන් 06 කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

***සැ. යු.-*** අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවල දී, එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂයය කොටස් දෙකම සමත් නම් පමණක් විෂය සමත් ලෙස සැලකිය යුතු ය.

06. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.
රෝහල් කොට්ඨාසයක උප්පැන්න, රෙජිස්ට්‍රාර්ධුරයකට බඳවා ගැනීමේ දී අයදුම්කරුවන්ට රජයේ රෝහල තුළ ප්‍රමාණවත් කාර්යාල පහසුකම් නොලැබෙන අවස්ථාවක රෝහලට කි. මී. 01ක් පමණ නුදුරින් කොට්ඨාසය තුළ පිහිටි සුදුසු වෙනත් ගොඩනැගිල්ලක තම කාර්යාලය පිහිටුවීමට හැකි විය යුතු ය.

07. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

08. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

09. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2026 අගෝස්තු මස 31 දින** හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

**එස්. ජලදීපන්,**
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2026 ජූලි මස 20 දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| මහනුවර | පස්බාගේ කෝරළය | නාවලපිටිය දිස්ත්‍රික් රෝහල ඇතුළත් පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උප්පැන්න, මරණ රෙජිස්ට්‍රාර් ධුරය (දෙමළ මාධ්‍යය) | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර |

07 - 534

---

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

සිංහල මාධ්‍ය උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරු

**මාතලේ දිස්ත්‍රික්කය**

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ / අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ:-

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ / අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අයවිය යුතු ය.

02. මෙම තනතුර වැටුප් නොලබන සේවාවක් වන අතර, ඒ සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය.

04. විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 65 වන අතර, වයස අවුරුදු 65-70 දක්වා රෙජිස්ට්‍රාර්වරයාගේ රාජකාරි ඉටු කිරීමේ ස්වභාවය, කායික හා මානසික යෝග්‍යතාව අනුව වසරින් වසර සේවය දීර්ඝ කිරීම සිදු කෙරේ. එලෙස සේවය දීර්ඝ නොකරන ඕනෑම අවස්ථාවක අදාළ රෙජිස්ට්‍රාර්වරයාගේ සේවය අවසන් කරනු ලැබේ.

05. විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අයවිය යුතු අතර වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

06. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02 ක් සහිතව විෂයයන් 06 කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

***සැ. යු.-*** අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවල දී, එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂයය කොටස් දෙකම සමත් නම් පමණක් විෂයය සමත් ලෙස සැලකිය යුතු ය.

07. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනෙකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

08. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

09. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

10. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2026 අගෝස්තු මස 31 දින** හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

**එස්. ජලදීපන්,**
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2026 ජූලි මස 20 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යොමු කළ යුතු ලිපිනය* |
|---|---|---|---|
| මාතලේ | මාතලේ | ගම්පහසිය කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා මාතලේ දකුණ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතලේ |
| මාතලේ | විල්ගමුව | හඳුන්ගමුව කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා මාතලේ නැගෙනහිර විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතලේ |

07 - 568

---

## ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පී නොවන සේවා ගණයේ ක්‍රීඩා භූමි සහයක තනතුර සඳහා බඳවා ගැනීම - 2026

නිවැරදි කිරීම

2026 පෙබරවාරි මස 27 වැනි දින අංක 2,478 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පී නොවන සේවා ගණයේ ක්‍රීඩා භූමි සහයක තනතුර සඳහා බඳවා ගැනීම - 2026 හි 5 (අ) හි ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබා දීමේ පටිපාටියෙහි ලකුණු ප්‍රමාණයන් ආයතනික මුද්‍රණ දෝෂයක් හේතුවෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ලකුණු ලබා දීමේ ප්‍රමාණයන්ට වඩා වෙනස් වී ඇති බැවින් පහත පරිදි නිවැරදි කර ඇත.

05. බඳවා ගැනීමේ ක්‍රමය :

(ආ)

| *ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ප්‍රමාණය* |
|---|---|---|
| 01. අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් | 30 | 40% |
| 02. පළපුරුද්ද | 35 | |
| 03. වෘත්තීය සුදුසුකම් | 30 | |
| 04. සම්මුඛ පරීක්ෂණයේ දී පිළිබිඹු කරන කුසලතාව | 05 | |
| **එකතුව** | **100** | |

**එස්. අච්චුදන්,**
අධ්‍යක්ෂ ජනරාල්,
ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව.

07 - 564

---

### ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

### ඇබෑර්තු

පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩුව පවතින ආරක්ෂක නිලධාරි තනතුර සඳහා මනා සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ට චරිතයකින් යුතු ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල කරගත් අයදුම්පත් අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් ද සමඟ **2026.08.17** වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ **"පාර්ලිමේන්තුවේ මහ ලේකම්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ"** යන ලිපිනයට **ලියාපදිංචි තැපෑලෙන් පමණක්** එවිය යුතු ය. තමන් අයදුම් කරන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කළ යුතු ය. (මෙම තොරතුරු www.parliament.lk වෙබ් අඩවිය ඔස්සේ ද ලබාගත හැකි ය).

**ආරක්ෂක නිලධාරි තනතුර (පුරප්පාඩු සංඛ්‍යාව - 03)**

**1. වැටුප් පරිමාණය:**

2025.03.25 දිනැති අංක 04/2025 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු. 47,240-9x540/10x590/3x680- රු. 60,040 /- වේ. (සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු. 87,000.00ක් පමණ වේ).

**2. අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද:**

සිංහල හෝ දෙමළ භාෂාවට සම්මාන සාමාර්ථයක් ද, ගණිතය හා ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථයන්ද සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් විෂයයන් හයකින් දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත්වී තිබීම;

*සහ*

වසර 10 කට නොඅඩු සම්මානනීය සේවාවක් සහිත යුද්ධ හමුදාවේ සැරයන් හෝ ඊට නොඅඩු තත්ත්වයේ තනතුරක් දරන ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවක (නිත්‍ය) සාමාජිකයෙකු හෝ වසර 10 කට නොඅඩු සම්මානනීය සේවාවක් සහිත සැරයන් හෝ ඊට නොඅඩු තත්ත්වයේ තනතුරක් දරන ශ්‍රී ලංකා පොලිසියේ සාමාජිකයෙකු වීම;

*හෝ*

අයදුම්පත් භාරගන්නා අවසන් දින වන විට පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ 'ඒ' හෝ 'බී' වැටුප් කාණ්ඩවලට අයත් තනතුරක වසර 10ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

**3. <u>වයස් සීමාව</u> :**

අයදුම්පත් භාරගැනීම අවසන් වන දිනට වයස අවුරුදු 30 ට නො අඩු හා අවුරුදු 50 ට නොවැඩි විය යුතු ය. (පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩල සාමාජිකයන් සඳහා මෙම උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

**4. බඳවා ගැනීමේ ක්‍රමය :**

ලිඛිත පරීක්‍ෂණයක් සහ සම්මුඛ පරීක්‍ෂණයක් මගිනි.

(*අ*) **ලිඛිත පරීක්ෂණය:**
භාෂා හැකියාව සහ සාමාන්‍ය දැනීම පරීක්ෂා කර බලනු ලබන අතර, ලිඛිත පරීක්ෂණයේ දී ලබා ගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව සියයකි (100).

(*ආ*) **සම්මුඛ පරීක්ෂණය :**
ලිඛිත පරීක්ෂණය සමත් වන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර, සම්මුඛ පරීක්ෂණයේ දී පහත සඳහන් නිර්ණායක අනුව ලකුණු ලබා දෙනු ලැබේ. එහි දී ලබා ගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව සියයකි (100).

| | **නිර්ණායක** |
|---|---|
| 01 | අමතර අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් |
| 02 | විෂය දැනුම |
| 03 | පළපුරුද්ද |
| 04 | පෞරුෂත්වය හා සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතා |

**5. සේවා නියමයන් හා කොන්දේසි :**

(i) මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය. තෝරාගනු ලබන අයදුම්කරුවන් මූලිකව වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර, රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක සේවය ස්ථිර කරනු ලැබූ පුද්ගලයෙක් තෝරා ගනු ලැබුවහොත්, ඔහු/ඇය වසරක වැඩ බැලීමේ කාලයකට යටත්ව පත් කරනු ඇත.

(ii) පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මක වන දිනය පාර්ලිමේන්තුවේ මහ ලේකම් විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට පාර්ලිමේන්තුවේ මහ ලේකම්ට බලය ඇත.

(iii) තෝරාගනු ලබන අයදුම්කරුවන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයට අදාළ වන මූල්‍ය හා දෙපාර්තමේන්තු රෙගුලාසිවලට යටත් වනු ඇත.

(iv) තෝරාගනු ලබන අයදුම්කරුවන් රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයකට අනුව වැන්දඹු හා අනත්දරු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට තම වැටුපෙන් දායක මුදල් ගෙවිය යුතු ය.

(v) තෝරාගනු ලබන අයදුම්කරුවන් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය විය යුතු ය.

(vi) තෝරාගනු ලබන අයදුම්කරුවන් පත් කරනු ලැබීමට පෙර ඔවුන් පිළිබඳව ආරක්ෂක නිෂ්කාශන වාර්තා ලබා ගනු ඇත.

**6.** අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල පිටපත් **(මුල් පිටපත් නොවේ)** සිය අයදුම්පත්වලට අමුණා එවිය යුතු අතර, ඉල්ලා සිටින විටෙක මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

(*අ*) උප්පැන්න සහතිකය;
(*ආ*) අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන සහතික;
(*ඇ*) වෘත්තීය සුදුසුකම් සනාථ කෙරෙන සහතික;
(*ඈ*) පළපුරුද්ද සනාථ කෙරෙන සහතික;

**7.** සන්නද්ධ හමුදාවල සහ ශ්‍රී ලංකා පොලීසියේ සේවය කරන අයදුම්කරුවන්, සිය අයදුම්පත් අදාළ සන්නද්ධ හමුදාධිපති හෝ පොලිස්පති හරහා එවිය යුතු ය.

**8.** තනතුරු ලබා ගැනීමේ අරමුණින් කවර හෝ ආකාරයකින් බලපෑම් කිරීම තනතුරු සඳහා නුසුදුසුකමක් වනු ඇත.

**9.** අයදුම්පත්‍රයෙහි සඳහන් වන කවර හෝ කරුණක් වැරදි යැයි යමකු තෝරා ගැනීමට පෙර සොයා ගනු ලැබුවහොත්, ඔහු/ ඇය නුසුදුස්සකු බවට නම් කරනු ලැබීමට ද, පත් කිරීමෙන් පසු එසේ අනාවරණය වුවහොත්, සේවයෙන් පහ කරනු ලැබීමට ද හේතු වනු ඇත.

**10.** අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව එවනු ලබන හෝ ඉහත සඳහන් කළ සහතිකවල පිටපත් රහිතව එවනු ලබන හෝ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් හරහා යොමු කරනු නොලබන අයදුම්පත් (දැනට රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ සේවය කරනු ලබන්නේ නම්) ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ද ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල නොකරන ලද අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**11.** සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම්, එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

හංස අබේරත්න,
*වැ.බ.* පාර්ලිමේන්තුවේ මහ ලේකම්.

2026 ජූලි මස 28 වැනි දින,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව**

**ආදර්ශ අයදුම්පත්‍රය**

**...................... තනතුර**

01. (අ) මුලකුරු සමඟ නම (සිංහලෙන්):-
........................................................................................................................
........................................................................................................................

(ආ) මුලකුරුවලින් හැඳින්වෙන නම් (සිංහලෙන්) :-
........................................................................................................................
........................................................................................................................

(ඇ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :- (Mr./Mrs. /Miss)
........................................................................................................................
........................................................................................................................
........................................................................................................................

02. ජාතික හැඳුනුම්පත් අංකය:-

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | |

03. (අ) i). පෞද්ගලික ලිපිනය :-
................................................................................................
................................................................................................

ii). දුරකතන අංකය :-

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

iii). WhatsApp දුරකතන අංකය :-

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

iv). විද්‍යුත් තැපැල් (e-mail) ලිපිනය:-.........................................................

(ආ) i).කාර්යාලයීය ලිපිනය :-
................................................................................................
................................................................................................

ii). දුරකථන අංකය:-

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

(ඇ) ප්‍රවේශ පත්‍රය තැපැල් කළ යුතු ලිපිනය -:

පෞද්ගලික : ☐ කාර්යාලයීය : ☐

04. (අ) උපන් දිනය:- වර්ෂය : ................ මාසය : .............. දිනය : ...............
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතු ය)

(ආ) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස:- අවුරුදු : ........ මාස : ........ දින : ........

05. විවාහක/ අවිවාහක බව :- (විවාහක/ අවිවාහක)

06. ස්ත්‍රී/ පුරුෂ භාවය :- (ස්ත්‍රී/ පුරුෂ)

07. ශ්‍රී ලංකාවේ පුරවැසියකු ද යන බව :- (ඔව්/නැත)

08. *අධ්‍යාපන සුදුසුකම් :-* (සහතිකවල පිටපත් ඇමිණිය යුතු ය)

| *විභාගය* | *විෂයය* | *සාමාර්ථයන්* | *සමත්වූ වර්ෂය* |
|---|---|---|---|
| අ.පො.ස (සා/පෙළ) | සිංහල/ දෙමළ | | |
| | ගණිතය | | |
| | ඉංග්‍රීසි | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

09. වෙනත් සුදුසුකම් :- (සහතිකවල පිටපත් ඇමිණිය යුතු ය)
........................................................................................................................................................................
........................................................................................................................................................................
........................................................................................................................................................................

10. පළපුරුද්ද :- (සහතිකවල පිටපත් ඇමිණිය යුතු ය)

| *ආයතනය/දෙපාර්තමේන්තුව* | *තනතුර* | *සේවා කාලය* |
|---|---|---|
| | | |
| | | |
| | | |

11. වත්මන් රැකියාව පිළිබඳ විස්තර - :

(අ) ආයතනයේ නම හා ලිපිනය :.......................................................................................
(ආ) මුල් පත්වීමේ දිනය :..............................................................................................
(ඇ) දැනට දරන තනතුර :...............................................................................................
(ඈ) මාසික මූලික වැටුප :...............................................................................................
(ඉ) දීමනා :.................................................................................................................
(ඊ) දළ වැටුප:..............................................................................................................

12. ඔබ කිසියම් සාපරාධී ක්‍රියාවකට උසාවියක දී වැරදිකරු වී ඇත් ද? (ඔව්/නැත)
එසේ නම් ඒ පිළිබඳ විස්තර දක්වන්න:-
..............................................................................................................................

ම විසින් මෙම අයදුම්පතෙහි සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. මෙහි සඳහන් යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බවට මා තෝරා ගැනීමට පෙර හෙළි වුවහොත්, මෙම තනතුර සඳහා මා නුසුදුස්සකු වීමටත්, තෝරා ගැනීමෙන් පසු හෙළි වුවහොත් වන්දියක් නොගෙවා මා සේවයෙන් පහකරනු ලැබීමටත් හේතු වන බව දනිමි.

දිනය :- ........................................ ........................................................,

අයදුම්කරුගේ අත්සන.

**ආයතන/ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

**(සන්නද්ධ හමුදාවල සහ ශ්‍රී ලංකා පොලීසියේ සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි.)**

පාර්ලිමේන්තුවේ මහ ලේකම්,

ශ්‍රී ලංකා යුද්ධ / ගුවන් / නාවික හමුදාවේ / පොලීසියේ .......................................... තනතුර දරන, ................................... ......................................... ගේ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි. ඔහු/ ඇය මෙම තනතුරෙහි ස්ථිර කර ඇති/ නොමැති බවත්, ඔහුගේ/ඇයගේ වැඩ සහ හැසිරීම සතුටුදායක බවත්, ඔහුට / ඇයට එරෙහිව විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, එවැනි කරුණක් පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත් සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත්, සේවයෙන් නිදහස් කළ හැක/ නොහැක.

දිනය :-.....................................

..........................................................................

දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ අත්සන

(නිල මුද්‍රාව)

07 - 565